**දේශීය ණය හා සංවර්ධන අරමුදල - 2013**

**-----------------------------------------------**

දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ( "අරමුදල") 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රඳවාගත් ඉපයීම් හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශ කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූල වීම

-----------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**පහත සඳහන් අනුකූල නොවීම් අනාවරනය විය.**

(i) මූල්‍ය ප්‍රකාශන වල දේපළ, පිරියත හා උපකරණවල සංසන්දනාත්මක සංඛ්‍යා හෙළිදරව් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ණය හා ලැබිය යුතු ගිණුම් සහ බදු වලට සම්බන්ධ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණු අතර, දේපළ, පිරියත හා උපකරණවලට සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් අවශ්‍ය තොරතුරු සපයා නොතිබුණි.

(iv) මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීමක් කර තිබුණ ද, ඒ බව නිවැරදිව හෙළිදරව් කර නොතිබුණි.

(v) මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් තුළ උප ලේඛන අංක සඳහන්ව තිබුණද, මූල්‍ය ප්‍රකාශන තුළ ඒවා පිළිබිඹු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10 – වාර්තාකරන කාලච්ඡේදයට පසු සිදුවීම්**

අරමුදල, මූල්‍ය ප්‍රකාශන අනුමත කළ දිනය හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 - ආදායම් බදු**

මූල්‍ය ප්‍රකාශන වල විලම්භිත බදු වත්කම්/ වගකීම් හඳුනාගෙන නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 -සේවක ප්‍රතිලාභ**

සේවක ප්‍රතිලාභ වලට අදාල වර්තමාන සේවා පිරිවැය, නැවත ඇස්තමේන්තු කළ ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම, අතීත සේවා පිරිවැය වැනි විස්තර හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) සමාලෝචිත වර්ෂය සඳහා රු. 14,994,954 ක ස්ථාවර තැන්පතු මත පොලී ආදායම, අරමුදල හඳුනාගෙන නොතිබුණි. එම නිසා, 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජන වටිනාකම හා සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) වැරදි ගණනය කිරීමක් හේතුවෙන් රු. 209,499,354 ක් වෙනුවට, රු. 250,162,653 ක් ලෙස හානිකරණ වියදමක් ආදායම් ප්‍රකාශනයට හර කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ ලාභය රු. 40,663,299 කින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) වැරදි ගණනය කිරීමක් හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුම් වල පොලිය හා අවිනිශ්චිත ලැබිය යුතු පොලී රු. 242,627 ක් වැඩියෙන් දැක්වුණි.

(ඈ) පළාත් පාලන ආයතනවලට ලබා දුන් ණය මත ලැබිය යුතු පොලී, ණය ශේෂය හා ආදායම හඳුනා ගැනීම සම්බන්ධ නිරීක්ෂණය වූ දුර්වලතා පහත දැක්වේ.

I. මූලික ණය ලෙස මූල්‍ය ප්‍රකාශන වල රු. 96,366,315 ක් පෙන්නුම් කළද, අරමුදලට රු.13,866,315 ක අලාභදායී ප්‍රතිඵලයක් වෙමින් එම ණය රු. 82,500,000 ක් ලෙස 2012 ජනවාරි 01 දින නැවත ලේඛන ගත කෙරිණි. කෙසේ වුවද, අදාල ණය ගිණුමේ මෙය ගලපා නොතිබුණු අතර එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු. 13, 866,315 කින් වැඩියෙන් දැක්වුණි.

II. අරමුදල භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2012 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය මුදල රු. 13,866,315 කින් අඩු කළද, මූලික ණය මත භාණ්ඩාගාරයට පොලී ගෙවීමට සිදු වී තිබුණි. එබැවින්, 2012 හා 2013 කාලච්ඡේද සඳහා පොලිය ලෙස රු.1,455 ,963 ක් වැඩිපුර අරමුදල ගෙවා තිබුණි.

(ඉ) බොල් ණය සඳහා ප්‍රතිපාදනය පමණක් නොව හානිකරණය සඳහා වෙන් කිරීම් ද අඩු කිරීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ පෙන්වන ණය හා ලැබිය යුතු දෑ රු. 23,262,479 කින් අඩුවෙන් දැක්විණි.

(ඊ) පළාත් පාලන යටිතල පහසුකම් වර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ණය ලේඛනයට අනුව, වර්ෂය සඳහා පොලී ආදායම හා 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී පිළිවෙලින් රු.167,146,395 ක් හා රු. 93,305,400 ක් විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවල ඒවා පිළිවෙලින් රු. 147,407,845 ක් හා රු. 74,931,381 ක් ලෙස දැක්විණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට පොලී ආදායම හා ලැබිය යුතු පොලී රු. 19,738,550 කින් හා රු.18,374,019 කින් අඩුවෙන් දැක්විණි.

(උ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ රු. 510,000 ක ණය වාරික අදාල ගිණුම්වලට මාරු කිරීමකින් තොරව වර්ෂයකට වඩා වැඩි කාලයක් පුරා අත්තිකාරම් ගිණුමේ රඳවා පැවතුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල පෙන්වන ණය ශේෂය සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දැක්විණි.

(ඌ) ණය ලේඛන අනුව, අරමුදල විසින් සපයන ලද ණය මත සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම රු. 52,956,299 ක් විය. කෙසේ වුවද, පොලී ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන වල රු.51,154,999 ක් පමණක් දක්වා තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම රු. 1,801,300 කින් අඩුවෙන් දැක්වුණි. තවද, රු. 8,364,306 ක් වටිනා ණයක් වෙනුවෙන් වන පොලිය ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(එ) නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ පොලී ගණනය කිරීමේ ලේඛන හා ණය ලෙජරය අනුව වර්ෂය සඳහා පොලී ආදායම රු. 126,512,986 ක් විය යුතු වුවද, රු.92,909,677 ක් පමණක් ආදායම ලෙස ගිණුම් වලට ගෙන තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු. 33,603,309 කින් අඩුවෙන් දැක්විණි.

(ඒ) නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියට අදාල පිළිවෙලින් රු. 1,216,741 ක් හා 1,306,001 ක් වටිනා 2012 වර්ෂය සඳහා වන ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් මත වන පොලී ආදායම් වැරදි ලෙස 2013 වර්ෂයේ ආදායම් ලෙස ගෙන තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශන වල සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම රු. 2,522,742 කින් වැඩියෙන් දැක්වුණි. තවද, නගර සභාවකට දෙන ලද ණයක් මත 2012 වර්ෂයට අදාල රු. 946,810 ක පොලී ආදායමක් 2013 වර්ෂය සඳහා ආදායමක් ලෙස සලකා තිබුණි. එබැවින් සමාන ප්‍රමාණයකින් පොලී ආදායම වැඩියෙන් දැක්වුණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව, කාර්යාල ලී බඩු මත ක්ෂය, වර්ෂයකට සියයට 05 ක අනුපාතයකට ගණනය කළ යුතු බව දක්වා තිබුණි. කෙසේ වුවද, 2008 වර්ෂයේ රු. 454,020 ක පිරිවැයකට මිලට ගත් කාර්යාල ලී බඩු සඳහා ක්ෂය වර්ෂයකට, සියයට 20 ක අනුපාතයකට ගණනය කර තිබුණි. එබැවින්, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය පිළිවෙලින් රු.317,814 කින් හා රු. 41,618 කින් වැඩියෙන් දැක්විණි.

(ඕ) ප්‍රදාන ශේෂයක් ණය ගිණුම තුළ වැරදියට හඳුනා ගැනීම හේතුවෙන්, පළාත් පාලන යටිතල පහසුකම් වර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාල 2013 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.4,068,968 කින් වැඩියෙන් දැක්විණි.

**2.2.3 නොසැසඳූ වෙනස්කම්**

**-----------------------**

ගිණුම් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සහ අනුරූප වාර්තා වල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 41,860,918 ක නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය.

**2.2.4 හඳුනා නොගත් වෙනස්කම්**

**---------------------------**

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ලැබිය යුතු පොලී ශේෂය සහ විගණනයට සපයන ලද ලේඛන වල දැක්වෙන අනුරූප ශේෂ අතර එකතුව රු. 16,921,025 ක වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස්කම් සඳහා හේතු විගණනයට පැහැදිලි නොකෙරිණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 754 | අරමුදල සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් රු. 300,157 ක් රු. 90,180 ක් හා රු. 35,270 ක් වටිනා ලිපි ද්‍රව්‍ය, කාර්යාල බෑග් 24 ක් හා ගණක යන්ත්‍ර 40 ක් මිලට ගෙන තිබුණද ,තොග ලේඛනය නිසියාකාරව යාවත්කාලීන කර නොතිබුණි. තවද, 2013 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** | අරමුදල අනුගමනය කරන බඳවා ගැනීමේ පටිපාටිය (SOR) | අරමුදලේ බඳවා ගැනීම් පටිපාටියට අනුව අරමුදලට කරන සියළු පත්කිරීම් කළ යුතුය. ඊට විරුද්ධව 2012 වර්ෂයේ දී නියෝජ්‍ය අධ්‍යක්ෂක (මෙහෙයුම්), තනතුර සඳහා අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් නැති නිලධාරියෙකු පත් කර තිබුණු අතර එම නිලධාරියා 2013 වර්ෂය අවසානය දක්වාත් එම තනතුරේ රාජකාරි කරමින් තිබුණි. |
| **(ඇ)** | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 246,455,922 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු. 335,404,859 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. 88,948,937 ක වර්ධනයක් දැක්වුණි. ප්‍රදානය කරන ලද ණය මත වන පොලී ආදායම රු. 14,991,233 කින් වැඩි වීම සහ ණය සඳහා වන හානිකරණය රු. 146,210,891 කින් අඩු වීම මෙම වර්ධනය සඳහා හේතු වී තිබුණි.

ක්ෂය, බදු වියදම් හා පුද්ගලික පඩිනඩි වල එකතුව රු. 14,351,144 ක් සැලකිල්ලට ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ අගය එකතු කිරීම රු. 233,904,778 ක සෘණ අගයක් විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අරමුදලේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2013 | 2012 |
|---|---|---|
| මුළු ආදායමට සාපේක්ෂව ශුද්ධ අලාභය (ප්‍රතිශතය) | 73.75 | 102.77 |
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 16.7:1 | 119:1 |
| මෙහෙයුම් වියදම් වලට සාපේක්ෂව කාර්යමණ්ඩල පිරිවැය (ප්‍රතිශතය) | 4.8 | 4.5 |

(අ) විගණනයට සපයන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 වර්ෂයේ සිට අරමුදල අලාභ ලබා තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේදී, ශුද්ධ අලාභය රු. 89,248,937 කින් අඩු වීම හේතුවෙන් ශුද්ධ අලාභ අනුපාතය 2012 වර්ෂයේ දී පැවති සියයට 102.77 සිට 2013 වර්ෂයේදී සියයට 73.75 දක්වා අඩු වී තිබුණි.

(ආ) ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් යටතේ හඳුනා ගැනීම හා ඉතිරි කිරීමේ ගිණුම්වල සැලකිය යුතු තැන්පතු ප්‍රමාණයක් පවත්වා ගැනීම ප්‍රධාන වශයෙන් හේතු වීමෙන් අරමුදල ඉහළ ජංගම වත්කම් අනුපාතයක් වාර්තා කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්ය සාධනය

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1993 අංක 24 දරන දේශීය ණය හා සංවර්ධන අරමුදල් (සංශෝධන) පනතේ 5 වන වගන්තිය අනුව, අරමුදල විසින් ණය ප්‍රදානය කිරීමේ අරමුණ, තාක්ෂණික සහාය ඇතුළත් මහජන උපයෝගිතාවයේ ඕනෑම කාර්යයක් සඳහා වේ. ඒ අනුව, ව්‍යාපෘති 05 ක් යටතේ අරමුදල ණය සපයා තිබූ අතර, 2013 අවසානයට හා ඉකුත් වර්ෂය අවසානයට හිඟ ණය ශේෂයන් පහත පරිදි වේ.

| ව්‍යාපෘතිවල නම | දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂය | |
|---|---|---|
| | 2013 | 2012 |
| | රු. | රු. |
| දේශීය ණය හා සංවර්ධන අරමුදල | 619,124,948 | 517,621,456 |
| නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 1,706,194,130 | 1,788,745,619 |
| පළාත් පාලන යටිතල පහසුකම් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 1,735,734,362 | 1,729,974,677 |
| පුද්ගලික බෝග සංවර්ධන ව්‍යාපෘතිය | 69,356,658 | 70,733,648 |
| ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ ව්‍යාපෘති | 9,215,880 | 9,995,449 |
| **එකතුව** | **4,139,625,978** | **4,117,070,849** |

ලබා ගත හැකි තොරතුරු අනුව, පළාත් පාලන ආයතන වලට සියයට 83 හා සියයට 85 ට වැඩි මූල්‍ය පහසුකම් පිළිවෙලින් නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ හා පළාත් පාලන යටිතල පහසුකම් වර්ධන ව්‍යාපෘතිය යටතේ සපයා තිබුණි. කෙසේ වුවද, අරමුදල මෙම ව්‍යාපෘති මඟින් ණය ප්‍රදානය කිරීම සඳහා වන ඉලක්ක ස්ථාපිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විවිධ ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම වෙනුවෙන් රු. මිලියන 300 ක මුදලක් වෙන් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී ණය ලෙස රු. මිලියන 225.47 ක් ලබා දී තිබුණි. මෙම ණයවල ප්‍රගතිය සාරාංශ කර පහත දක්වා ඇත.

| ක්‍රියාකාරකමේ නම | අරමුදල් වෙන් කිරීම | | වර්ෂය තුළ නිකුත් කළ අරමුදල් | | අරමුදල් උපයෝජනය වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති ගණන | වටිනාකම රු.මි. | ව්‍යාපෘති ගණන | වටිනාකම රු.මි. | |
| යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීම | 15 | 75 | 25 | 197.86 | 264 |
| කාර්යාල ගොඩනැගිලි, පුස්තකාල හා අනුස්මරණ ශාලා ඉදි කිරීම | 3 | 25 | - | - | - |
| ආදාහනාගාර ඉදි කිරීම, | 4 | 25 | 1 | 1.97 | 8 |
| සතිපොළවල් හා ආර්ථික මධ්‍යස්ථාන ඉදි කිරීම | 6 | 30 | 4 | 10.65 | 36 |
| වෙළඳපළ ගොඩනැගිලි ඉදිකිරීම | 4 | 50 | 3 | 14.99 | 30 |
| පාරිසරික හා සංචාරක ව්‍යාපෘති | - | 10 | - | - | - |
| මාර්ග සංවර්ධනය | - | 20 | - | - | - |
| අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති | 2 | 25 | - | - | - |
| ජල ව්‍යාපෘති | 2 | 15 | - | - | - |
| වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති | 8 | 25 | - | - | - |
| **එකතුව** | **44** | **300** | **33** | **225.47** | **75** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අරමුදල, අපද්‍රව්‍ය කළමනාකරණයද ඇතුළත්ව ක්‍රියාකාරකම් 05 ක් වෙනුවෙන් රු.මිලියන 120 ක මුදලක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම ක්‍රියාකාරකම් ආරම්භ කර හෝ නොතිබුණි.

(ii) අනෙකුත් ක්‍රියාකාරකම් වලින්, යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීමට වෙන් කළ අරමුදල් හැර, වර්ෂ අවසානයට කාර්ය සාධනය සියයට 40 ට වඩා අඩු බව පෙන්නුම් කෙරිණි. යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීම වෙනුවෙන් රු. මිලියන 75 ක් පමණක් වෙන්කර තිබුණද, අරමුදල ඒ වෙනුවෙන් රු. මිලියන 197.86 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, රු. මිලියන 225 ක් වෙන්කර තිබුණු අනිකුත් ක්‍රියාකාරකම්ද පළාත් පාලන ආයතනවල වැදගත් කාර්යයන් විය.

**4.2 නිෂ්ක්‍රීය වත්කම්**

ණය නිකුත් කිරීමේ හා අයකර ගැනීමේ අරමුණ වෙනුවෙන් පළාත් පාලන යටිතල පහසුකම් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2009 වර්ෂයේදී ප්‍රාදේශීය ජාලයක් (මෘදුකාංගයක්) මිලට ගැනීම හා ස්ථාපිත කිරීම වෙනුවෙන් රු. 1,302,214 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, මෙම වත්කම ස්ථාපනය කරන ලද දින සිටම අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

**4.3 හඳුනා ගත් අලාභ**

ණය කළමනාකරණ පද්ධතිය හා මූල්‍ය ගිණුම්කරණය සඳහා 2009 වර්ෂයේදී රු. 235,200 ක පිරිවැයකට මිලට ගත් මෘදුකාංගය අපේක්ෂිත අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබූ අතර, එය අරමුදලේ අවශ්‍යතාවයට ගැලපී නොතිබුණි.

## 4.4 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදලේ ප්‍රධාන විධායක නිළධාරි ලෙස නිලධාරීන් 05 දෙනෙකු වරින් වර පත්කර තිබුණි. තවද, වර්තමාන ප්‍රධන විධායක නිලධාරී ද වසරක කාලච්ඡේදයක් සඳහා පමණක් පත්කර තිබුණි. එබැවින් නිතරම ප්‍රධාන තනතුරු වෙනස් වීම අරමුදලේ සුමට ක්‍රියාකාරිත්වයට බලපෑ හැකිය.

(ii) 2014 වර්ෂය තුළදී කොමසාරිස් මණ්ඩලය විසින් අවස්ථා දෙකකදී නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් හා පරිපාලන)ලෙස අරමුදලේ සහකාර කළමණාකරු පත්කර තිබුණද, 2014 වර්ෂය අවසන් වන විටත් ඔහුට විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කර නොතිබුණි. එසේම 2015 අගෝස්තු 01 සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන) ලෙස වෙනත් අයෙකු පත් කිරීමට 2015 දෙසැම්බර් 29 දින පැවති රැස්වීමේදී කොමසාරිස් මණ්ඩලය තීරණය කර තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු ආවරණය කිරීමට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක පත්කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණු අතර, 2013 වර්ෂය අවසන් වන විටත්, අරමුදලේ ප්‍රධාන අවදානම් ප්‍රදේශ ආවරණය කිරීමට ස්ථිර අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වා යවන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | 2012 වර්ෂයේ කරන ලද වැරදි නිවැරදි කිරීම් වෙනුවෙන් ආදායම් ප්‍රකාශනයට තබන ලද ඇතැම් සටහන් 2013 වර්ෂය සඳහා ඉදිරියට ගෙන යමින් තිබුණි. එසේම, අරමුදල විසින් පොදු ලෙජරය නිසියාකාරව පවත්වාගෙන නොගොස් තිබුණි. |
| (ආ) | හිඟ ණය හා පොලී අයකර ගැනීම | ණය අයකර ගැනීමට විධිමත් සැලැස්මක් ක්‍රියාවේ යෙදවීමක් නිරීක්ෂණය නොවුණි. ඒ අනුව අරමුදල විසින් ලබා දෙන ලද වැඩි ණය ප්‍රමාණයක් හිඟ හිටි ලෙස වාර්තා වී තිබුණි. තවද, අරමුදලට වන ලාභදායිත්වය ගැන සැලකීමකින් තොරව සමහර අක්‍රීය ණය නැවත ලේඛනගත( rescheduled ) කර තිබුණු අතර එම නැවත ලේඛනගත කර තිබූ ණයවලින් වැඩි ප්‍රමාණයකට අදාල ගැලපීම් නැවත ලේඛන ගත කර ඇති තොරතුරු පරිදි මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. |